# 10 ශ්‍රේණිය සිංහල-වාක්‍ය රීති

# ඒකකය-09 වැඩපොත

- කර්ම කාරක වාක්‍ය
- කර්තෘ කාරක වාක්‍ය
- විශේෂ වාක්‍ය රීති

(පසුගිය විභාග ප්‍රශ්නද ඇතුළත් කර ඇත.)

( පිළිතුරු සහිතයි )



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

{9 ඒකකය - වාක්‍ය රීති : පෙළ පොත අභ්‍යාස සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි සකස් කර ඇත.}

# 9) කර්තෘකාරක වාක්‍ය සහ කර්මකාරක වාක්‍ය

- වාක්‍යයක උක්ත කර්තෘ හා ආඛ්‍යාතය (නැත හොත් කෘදන්ත ක්‍රියාව) එකිනෙක පුරුෂ, වචන හා ලිංග වශයෙන් ගැළපීමෙන් නිර්මාණය කෙරෙන වාක්‍ය, **කර්තෘ කාරක** වාක්‍ය නමින් හැඳින්වෙයි.

| කාලය | පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|---|
| වර්තමාන | ප්‍රථම | මිනිසා ගෙයක් සාදයි. | මිනිස්සු ගෙයක් සාදති. |
| | මධ්‍යම | නුඹ ගෙයක් සාදහි. | නුඹලා ගෙයක් සාදහු. |
| | උත්තම | මම ගෙයක් සාදමි. | අපි ගෙයක් සාදමු. |
| අතීත | ප්‍රථම | මිනිසා ගෙයක් සෑදීය. | මිනිස්සු ගෙයක් සෑදූහ. |
| | මධ්‍යම | නුඹ ගෙයක් සෑදීහි. | නුඹලා ගෙයක් සෑදූහු. |
| | උත්තම | මම ගෙයක් සෑදීමි. | අපි ගෙයක් සෑදූමු. |
| අනාගත ⋆ | ප්‍රථම | මිනිසා ගෙයක් සාදයි. | මිනිස්සු ගෙයක් සාදති. |
| | මධ්‍යම | නුඹ ගෙයක් සාදහි. | නුඹලා ගෙයක් සාදහු. |
| | උත්තම | මම ගෙයක් සාදමි. | අපි ගෙයක් සාදමු. |

උදාහරණ:- **ගොවියෝ ගවයන් බඳිති**

- කර්තෘ කාරක වාක්‍යයක් **කර්ම කාරක වාක්‍යයක්** බවට පත් කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර හා ඒ සඳහා උදාහරණ පහත දැක්වේ.

1 උක්ත කර්තෘ අනුක්ත කරන්න :- ගොවියෝ - ගොවියන්
2 අනුක්ත කර්තෘට පසු ව විසින් එකතු කරන්න :- ගොවියන් විසින්
3 අනුක්ත කර්මය උක්ත කරන්න:- ගවයන් - ගවයෝ
4 උක්ත වූ කර්මයට ගැළපෙන පරිදි හා දී ඇති වාක්‍යයේ කාලයට (අතීත-අනතීත) ගැළපෙන ක්‍රියා පදයක් යොදන්න:- බැඳෙති/බඳිනු ලැබෙති.

උදාහරණ:- ....................................................................................................

**1. පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍ය, කර්ම කාරක වාක්‍ය බවට හරවා ලියන්න.**

1 මම නිරතුරුව ම පොත පත මිල දී ගනිමි.

....................................................................................................

2 විනිසුරුතුමා චූදිතයන් නිදහස් කළේ ය.

....................................................................................................

3 උද්‍යෝගයෙන් කටයුතු කළ ගොවීහු මේ කන්නයේ සරු අස්වැන්නක් ලැබූහ.

....................................................................................................

4 මාධවී මීටර් 100 ධාවන තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගත්තී ය.

..............................................................................................................

5 ඔවුහු නිකරුණේ අප වෙහෙසූහ.

..............................................................................................................

**2. පහත දැක්වෙන කර්ම කාරක වාක්‍ය, කර්තෘ කාරක වාක්‍ය බවට හරවා ලියන්න.**

1 සතුරන් විසින් අපි පීඩාවට පත් කරනු ලැබුණෙමු.

..............................................................................................................

2 කම්කරුවා විසින් තම සේවා කටයුතු ස්වාමියාට පහදා දෙන ලදි.

..............................................................................................................

3 අධ්‍යක්ෂතුමා විසින් විද්‍යාලයීය නව ගොඩනැගිල්ල විවෘත කෙරෙයි.

..............................................................................................................

4 අප විසින් නුඹ දකිනු ලැබුණෙහි.

..............................................................................................................

5 ළමයින් විසින් චිත්‍ර අඳිනු ලැබේ.

..............................................................................................................

**3. පහත සඳහන් කෙටි ඡේද කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය යෙදෙන පරිදි ලිඛිත ව්‍යවහාරයෙන් ලියන්න.**

1 වනාන්තර මිනිසුන්ට සම්පතක්. ඉන් අපට ලැබෙන ප්‍රයෝජන අතිමහත්. ඒ බව හඳුනාගත් දූරදර්ශී මිනිස්සු, වන සම්පත ආරක්ෂා කර ගැනීමට කටයුතු කරනවා. අදූරදර්ශී මිනිස්සු වන සම්පත විනාශ කරනවා.

2 මුදල් ඇමතිතුමා අය-වැය කතාව ඉදිරිපත් කළා. ඉකුත් වර්ෂයේ ආර්ථික සංවර්ධනය සලකා බැලූ ඔහු නව ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළ අනාවරණය කළා. මන්ත්‍රීවරුන් නව යෝජනා ඉදිරිපත් කළා. විපක්ෂයේ මන්ත්‍රීවරු ද සතුට පළ කළා. ටික දෙනෙක් ඔහුගේ යෝජනා විවේචනය කළා.

3 සරසවියට නවක සිසුන් පැමිණේ. ජ්‍යෙෂ්ඨ සිසුන් නවකයින් ආදරයෙන් පිළිගනියි. සරසවි ඇදුරන් දේශන කටයුතු ආරම්භ කරයි. නවක සිසුන් සතුටින් ඉගෙන ගනියි.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

- කර්ම කාරකයට හැරවිය හැක්කේ **සකර්මක ක්‍රියා** පදයන් ඇති වාක්‍ය පමණි ක්‍රියාව අකර්මක වේ නම් වාක්‍ය කර්ම කාරකයට හැරවිය නො හැකි ය.
- උදාහරණ:-
  1 ගායකයා ගී ගයයි. **(සකර්මක වාක්‍යය)**
  2 මල් පිපෙයි. **(අකර්මක වාක්‍යය)**

# විශේෂ වාක්‍ය රීති

**1. ආඛ්‍යාතය සම්පූර්ණ කිරීම සඳහා කර්තෘ පදයට අමතර ව තවත් නාම පදයක් උක්ත කිරීම**
(අවසාන ක්‍රියාවෙන් කියවෙන්නේ ඒ දෙදෙනා ම පිළිබඳ ව වන බැවින් මෙවැනි වාක්‍යයක ආඛ්‍යාතයට උක්ත දෙකක් වෙයි. එසේ හෙයින් මෙවැනි වාක්‍ය **ද්විත්ව උක්ත වාක්‍ය** නමින් ද ආඛ්‍යාතයේ අඩුව පුරවා සම්පූර්ණ කරන හෙයින් **ආඛ්‍යාත පූරණ** නමින් ද හැඳින්වේ.)

උදාහරණ:- 1 අපි නීතිගරුක පුරවැසියෝ වෙමු.
2 ඕ/ ඈ නිළියක් වූවා ය/ වෙයි.
3 තුඹලා අනාගත නායකයෝ වෙහු.
4 ජෝර්ජ් කීට් විදග්ධ චිත්‍ර ශිල්පියෙක් වෙයි.
5 අපි නීතිගරුක පුරවැසියෝ ය/ යි.
6 තුඹලා අනාගත නායකයෝ ද?
7 අශෝක රජතුමා දැහැමි පාලකයෙක් වූ.
8 අපි ශ්‍රී ලාංකික පුරවැසියෝ.

- **නිදොස් කර ලියන්න.**

1 ඔවුහු ක්‍රීඩකයන් වෙති. × -..........................................................................................
2 මාර්ටින් වික්‍රමසිංහ විශිෂ්ට ලේඛකයකු වෙයි. × -......................................................
3 අසෝක රජතුමා දැහැමි පාලකයකු විය. × -..........................................................................
4 අපි නීතිගරුක පුරවැසියන් වෙමු. × -.................................................................................
5 ඕ/ ඈ නිළියක වූවා ය/ වෙයි. × -......................................................................................
6 තුඹලා අනාගත නායකයන් වෙහු. × -..................................................................................
7 ජෝර්ජ් කීට් විදග්ධ චිත්‍ර ශිල්පියකු වෙයි. ×-..........................................................

**2. උක්තය සම්පූර්ණ කිරීම සඳහා කර්තෘ පදයට අමතර ව තවත් නාම පදයක් උක්ත කිරීම.**
(උක්තය වසයෙන් යෙදෙන ප්‍රාණවාචී නාම පදයකට පසු ව **සංඛ්‍යාර්ථවත් හෝ සමූහාර්ථවත්** පදයක් යෙදෙන කල සංඛ්‍යාව හඟවන පදය හා එක් වන පිරිස් වාචී දෙන/ දෙනා යන පද බහු වචනය ගනී.මේ රීතිය **උක්ත පූරණ යෝගය** යනුවෙන් ද හැඳින්වේ.)

උදාහරණ:-1 අපි සියල්ලෝ ම ශ්‍රී ලාංකිකයෝ වෙමු.
2 සිසුහු තිදෙනෙක් විශිෂ්ට සම්මාන හිමි කර ගත්හ.
3 කම්කරුවෝ පස් දෙනෙක් සතියකින් පාලම තනා නිම කළහ.
4 සොරු දෙදෙනෙක් අත්අඩංගුවට පත් වූහ.
5 ගොන්නු දෙදෙනෙක් ගැල ඇද්දෝ ය.
6 සැකකරුවෝ සියලු දෙනා නිදහස් කරනු ලැබූහ.
7 ..........................................................................................................
8 ..........................................................................................................

**3. ප්‍රශ්න වාචී යෙදුමකින් අවසන් වන වාක්‍යයක යෙදෙන කර්තෘ වාචක නාම පදය අනුක්ත ස්වරූපය ගනී.**

උදාහරණ:- 1 මිනිසුන් අවංක නොවන්නේ ඇයි?
2 දක්ෂ ක්‍රීඩිකාවක වන්නේ කෙසේ ද?
3 අප සාමය ළ!ගා කර ගන්නේ කවදා ද?
4 සංගමයේ සාමාජිකයන් බලාපොරොත්තු වන්නේ මොනවා ද?
5 ..........................................................................................................
6 ..........................................................................................................

**4. ඇත, නැත, හැකි, යුතු, මැනවි, යෙහෙකි, වටී යන පදයකින් අවසන් වන වාක්‍යයන්හි කර්තෘ වාචක නාම පදය අනුක්ත ස්වරූපය ගනී.** (ඇත/නැත වලට මුලින් පූර්ව ක්‍රියාවක් හෝ භාව ක්‍රියාවක් යෙදුණ හොත් පමණි)

උදාහරණ:- 1 ගුරුවරුන් ඇතැම් පාඩම් අත් හරිනු ඇත.
2 සිසුන් පන්තියට පැමිණ නැත.
3 අප සමගිදම් රැකිය යුතු ය.
4 පයින් යන්නන් පාරේ දකුණු පසින් යා යුතු ය.
5 සියලු මිනිසුන් සත්‍යගරුක විය යුතු ය.
6 මා මහණදම් පිරිය යුතු ය.
7 පයින් යන්නන් පාරේ දකුණු පසින් යැම මැනවි.
8 සියලු මිනිසුන් සත්‍යගරුක වීම මැනවි.
9 අප මේ ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා අධිකරණය හමුවට යැම මැනවි.
10 අප ගිලනුන්ට උවටැන් කරනු වටී.
11 ඔවුන් එය වටහා ගැනීම යෙහෙකි.
12 ..................... සිරිපා කරුණාකර නැත.
13 ...................... සුදානම් වී ඇත.
14 ...................... මිහිරි ගීයක් ගයනු ඇත.
15 ...................... කථාවක් පවත්වනු ඇත.
16 ...................... සීගිරිය නරඹා නැත.

**5. ඇත, නැත, හැකි, යුතු යන රූප වරනැඟී වාක්‍යයක යෙදෙන කල ඊට සම්බන්ධ වන කර්තෘ උක්ත ස්වරූපය ගනී.**

උදාහරණ:-1 **මම** එය කියවා ඇත්තෙමි.
2 **අපි** සමගිදම් රැකිය යුත්තෙමු.
3 **පයින් යන්නෝ** පාරේ දකුණු පසින් යා යුත්තා හ.
4 සියලු **මිනිස්සු** සත්‍යගරුක විය යුත්තෝ ය.
5 **මම** මහණදම් පිරිය යුත්තෙමි.
6 ළමයෙක් කථාවක් පවත්වනු ..........................
7 සංචාරකයෝ සීගිරිය නරඹා ..........................
8 කුරුල්ලෝ කැදලි කරා පියඹනු ..........................

**6. තෙමේ/ තෙම , තොමෝ, තුමූ පද භාවිතය**
(**තෙමේ/ තෙම , තොමෝ, තුමූ** ප්‍රාණවාචී සර්ව නාම උක්ත රූප වේ. **තෙමේ/ තෙම** යන්න පුරුෂ ලිංග ඒක වචන යි. **තොමෝ** යන්න ස්ත්‍රී ලිංග ඒකවචන යි. තෙමේ, තොමෝ යන දෙකෙහි බහු වචනය **තුමූ** වේ.)

උදාහරණ :-1 ඒ තෙම/ තෙමේ ගමට ගියේ ය.
2 ඕ තොමෝ ගමට ගියා ය.
3 ඔවුහු තුමූ ගමට ගියහ.
4 සූර්ය තෙම/ තෙමේ චණ්ඩ රශ්මිය පතුරුවන්නට විය.
5 නදී තොමෝ සෙමෙන් ගලා බසින්නී ය.
6 ..................................................................................................
7 ..................................................................................................
8 ..................................................................................................
9 ..................................................................................................

**1. නිවැරදි වාක්‍යයක් වීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.**

1 සියලූ ජයග්‍රාහකයෝ පැරකුම් විද්‍යාලයේ (ශිෂ්‍යයන්/ ශිෂ්‍යයෝ) වූහ.

2 නිවැරදි ව්‍යාකරණ රීති (අපි/ අප) අනුගමනය කළ යුතු ය.

3 නොපසුබට උත්සාහයෙන් කටයුතු කළ ඕ තොමෝ මෙවර විභාගයෙන් සමත් (වූවා ය/ විය).

4 සියලූ (රියැදුරන් /රියැදුරෝ) මාර්ග නීති අනුගමනය කළ යුත්තෝ ය.

5 පොදු ප්‍රශ්න විසඳීම සඳහා (නගරවාසීහු/ නගරවාසීන්) ඉදිරිපත් වීම මැනවි.

**2. පහත සඳහන් වාක්‍ය සදොස් නම් ඊට හේතු දක්වා නිදොස් කර ලියන්න.**

1 දෙස බස රැක ගැනීමට අපි නිබඳ ව තැත් කළ යුතුය.

..........................................................................................................................................

..........................................................................................................................................

2 සියලූ දේශපාලනඥයෝ ආත්මාර්ථකාමී පුද්ගලයන් නොවේ.

..........................................................................................................................................

..........................................................................................................................................

3 දරුවෝ දෙමාපියන්ට කීකරු වීම මැනවි.

..........................................................................................................................................

..........................................................................................................................................

4 ගුරුවරු මීට පක්ෂ ව දැක්වූ අදහස් කවරේ ද?

..........................................................................................................................................

..........................................................................................................................................

5 ඕ තොමෝ ආදරයෙන් මවුපියන් රැකබලා ගත්තේ ය.

..........................................................................................................................................

..........................................................................................................................................

6 ඔවුන් නිදහස පතා සටන් කළ යුත්තෝ ය.

..........................................................................................................................................

..........................................................................................................................................

**3 පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.**

1 දෙමාපියෝ අප යහමග යැවූහ.

..........................................................................................................................................

2 දරුවෝ ක්‍රිකට් ක්‍රීඩා කරති.

..........................................................................................................................................

3 ගායකයෝ රසිකයන් සතුටට පත් කළහ.

..........................................................................................................................................

4. කාර්මිකයෝ උද්ඝෝෂණය කරති.

..........................................................................................................................................

5 දේශප්‍රේමීහු දේශය ආරක්ෂා කළහ.

..........................................................................................................................................

# පසුගිය විභාග ගැටළු

(11) උක්ත නාම පද පමණක් යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) මිනිසා, අශ්වයා, ළමයෙක්, කාන්තාවෝ (2) කතක්, රැජිනක, දරුවා, මිනිස්සු

(3) සොරා, නිළියක, අපි, ගුරුවරයා (4) මිනිසෙකු සතකු වෙළෙන්දකු සොරකු

(viii) පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කරන්න.

(අ) පෙර දා වට වැස්සෙන් නදී තොමෝ ප්‍රචණ්ඩ වූහ.

(ආ) සියලු ශිෂ්‍යයෝ විභාගය සමත් වීම යෙහෙකි.

(ix) දී ඇති කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයටත් කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයටත් හරවන්න.

(අ) නීතිඥයන් විසින් තම සේවාදායකයෝ දැනුවත් කරන ලදහ.

(ආ) බුද්ධිමත් මිනිස්සු සොබා දහම ආරක්ෂා කරති.

2018 western p. Term test

---

(vii) පහත සඳහන් (අ) සහ (ආ) හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) දරුවෝ ගුරු දෙගුරුන්ට කීකරු වීම මැනවි.

(ආ) ලාංකිකයෝ සාමය ළඟා කරගන්නේ කවදා ද?

(ix) පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) ශ්‍රී ලාංකිකයෝ දෙදෙනෙක් "රාවණාවන්" චන්ද්‍රිකාව අභ්‍යවකාශගත කිරීමට සමත් වූහ.

(ආ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කිරීම සඳහා නව තාක්ෂණික මෙවලම් භාවිත කරති.

2019 South p. Term test

---

❖ 23 සහ 24 වාක්‍යවල උක්ත රූපය වැරදියට යොදා ඇති වාක්‍ය තෝරන්න .

(23)
1. ධනය ඇත්තන් මුදල් වියදම්කොට පින් දහම් කරති .
2. මමද එම් එම දින
3. නගර දෙකක් සතුරන් අතට පත්විය .
4. අයෙක් සිටියෝ වාද ඇසූමට

(24)
1. ඒ පර්වත ශිඛර අප විසින් දක්නා ලදී.
2. මිනිස්සු ගස් කපද්දී අපි එතැනට ගියෙමු .
3. සඟ වෙද ගුරු ගොවි කම්කරු බල ඇණියෙන් සිවු දිග සැරසේවා !
4. ඔහු කෘෂි විද්‍යාවේ හසළ බුද්ධිමතකු විය .

2016 Western p. Term test

❖ 29 සිට 31 දක්වා ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව වැරදි එක් වාක්‍යයක් ඇත. අදාළ පිළිතුර තෝරන්න.

(29)
1. අපි නීතිගරුක පුරවැසියෝ වෙමු.
2. ඔවුහු දක්ෂ ශිෂ්‍යයෝලු .
3. ගොන්නු දෙදෙනෙකු ගැල ඇද්දාහ .
4. වෙරළ දිගේ සැරසිල්ලක් මෙන් හරිත වර්ණ ශාකයෝ පෙනෙන්නට වූහ.

(30)
1. ළමයින් විසින් චිත්‍ර අඳිනු ලැබේ.
2. අශෝක රජතුමා දැහැමි පාලකයෙක් විය.
3. කුමාර තෙමේ ස්නානය පිණිස උයනට ගියාය.
4. සියලු මිනිසුන් සත්‍ය ගරුක විය යුතුය.

(31)
1. දරුවන් වැඩිහිටියන් ට ගරු කිරීම වටී.
2. අප විභාගයට උනන්දු වන්නේ කවදාද ?
3. සිසුහු පන්තියට පැමිණ ඇත.
4. නුඹලා සියලු කටයුතු සාර්ථකව නිම කළෙහුය.

(32)
A. මම හාන්සි පුටුවේ වාඩිවීමි. දරුවා ද ඉදිරියේ ඇති පුටුවේ වාඩි විය.
B. ඔබ හොඳින් පාඩම් කළ යුතු ය. විභාගයෙන් ජය ගත හැක
C. ගංවතුර ගලා ආවේය . ගෙවල් සියල්ල ද යටවිය.
D. ගුරුවරයා විද්‍යාගාරයට ගියේය. සිසුහු ද විද්‍යාගාරයට ගොස් වාඩිවූහ.

v. අ) පහත වාක්‍ය කර්මකාරකයට හරවන්න.
විදුහල්පතිතුමා ශිෂ්‍යයෙකු කැඳවයි.

ආ) පහත වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.
කම්කරුවා විසින් තම සේවා කටයුතු ස්වාමියාට පහදා දෙන ලදී.

ix. පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.

අ) ඕ තොමෝ ගමට ගියහ.

ආ) ඔවුන් නිදහස පතා සටන් කළ යුත්තෝ ය.

My note
G.10
071-9020298

# 9) කර්තෘකාරක වාක්‍ය සහ කර්මකාරක වාක්‍ය

- වාක්‍යයක උක්ත කර්තෘ හා ආඛ්‍යාතය (නැත හොත් කෘදන්ත ක්‍රියාව) එකිනෙක පුරුෂ, වචන හා ලිංග වශයෙන් ගැළපීමෙන් නිර්මාණය කෙරෙන වාක්‍ය, **කර්තෘ කාරක** වාක්‍ය නමින් හැඳින්වෙයි.

| කාලය | පුරුෂය | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| වර්තමාන | ප්‍රථම | මම ගෙයක් සාදයි. | මිනිස්සු ගෙයක් සාදති. |
| | මධ්‍යම | නුඹ ගෙයක් සාදහි. | නුඹලා ගෙයක් සාදහු. |
| | උත්තම | මිනිසා ගෙයක් සාදයි. | අපි ගෙයක් සාදමු. |
| අතීත | ප්‍රථම | මිනිසා ගෙයක් සෑදුවේ ය. | මිනිස්සු ගෙයක් සෑදූහ. |
| | මධ්‍යම | නුඹ ගෙයක් සෑදුවෙහි. | නුඹලා ගෙයක් සෑදුවෙහු. |
| | උත්තම | මම ගෙයක් සෑදුවෙමි. | අපි ගෙයක් සෑදුවෙමු. |
| අනාගත | ප්‍රථම | මම ගෙයක් සාදයි. | මිනිස්සු ගෙයක් සාදති. |
| | මධ්‍යම | නුඹ ගෙයක් සාදහි. | නුඹලා ගෙයක් සාදහු. |
| | උත්තම | මම ගෙයක් සාදමි. | අපි ගෙයක් සාදමු. |

උදාහරණ:- **ගොවියෝ ගවයන් බඳිති**

- කර්තෘ කාරක වාක්‍යයක් **කර්ම කාරක වාක්‍යයක්** බවට පත් කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර හා ඒ සඳහා උදාහරණ පහත දැක්වේ.

1 උක්ත කර්තෘ අනුක්ත කරන්න :- ගොවියෝ - ගොවියන්
2 අනුක්ත කර්තෘට පසු ව විසින් එකතු කරන්න :- ගොවියන් විසින්
3 අනුක්ත කර්මය උක්ත කරන්න:- ගවයන් - ගවයෝ
4 උක්ත වූ කර්මයට ගැළපෙන පරිදි හා දී ඇති වාක්‍යයේ කාලයට (අතීත-අනතීත) ගැළපෙන ක්‍රියා පදයක් යොදන්න:- බැඳෙති/බඳිනු ලැබෙති.

උදාහරණ:- ගොවියන් විසින් ගවයෝ බඳිනු ලබති

**1. පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍ය, කර්ම කාරක වාක්‍ය බවට හරවා ලියන්න.**

1 මම නිරතුරුව ම පොත පත මිල දී ගනිමි.
මා විසින් නිරතුරුව ම පොතපත මිලදී ගනු ලබයි.

2 විනිසුරුතුමා චූදිතයන් නිදහස් කළේ ය.
විනිසුරුතුමා විසින් චූදිතයෝ නිදහස් කරනු ලැබූහ.

3 උද්‍යෝගයෙන් කටයුතු කළ ගොවිහු මේ කන්නයේ සරු අස්වැන්නක් ලැබූහ.
උද්‍යෝගයෙන් කටයුතු කළ ගොවීන් විසින් මේ කන්නයේ සරු අස්වැන්නක් ලබා ගනිතිය. / ලැබෙති ය.

4 මාධවී මීටර් 100 ධාවන තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගත්ති ය.

මාධවී විසින් 100m ධාවන තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගනු ලැබුවේය

5 ඔවුහු නිකරුණේ අප වෙහෙසූහ.

ඔවුන් විසින් නිකරුණේ අපි වෙහෙසනු ලැබුවෙමු.

**2. පහත දැක්වෙන කර්ම කාරක වාක්‍ය, කර්තෘ කාරක වාක්‍ය බවට හරවා ලියන්න.**

1 සතුරන් විසින් අපි පීඩාවට පත් කරනු ලැබුණෙමු.

සතුරෝ අප පීඩාවට පත් කළහ.

2 කම්කරුවා විසින් තම සේවා කටයුතු ස්වාමියාට පහදා දෙන ලදී.

කම්කරුවා තම සේවා කටයුතු ස්වාමියාට පහදා දුන්නේය.

3 අධ්‍යක්ෂතුමා විසින් විද්‍යාලයීය නව ගොඩනැගිල්ල විවෘත කෙරෙයි.

අධ්‍යක්ෂතුමා විද්‍යාලයීය නව ගොඩනැගිල්ල විවෘත කළේය.

4 අප විසින් නුඹ දකිනු ලැබුණෙහි.

අපි නුඹ දැක්කෙමු.

5 ළමයින් විසින් චිත්‍ර අඳිනු ලැබේ.

ළමයි චිත්‍ර අඳිති.

**3. පහත සඳහන් කෙටි ඡේද කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය යෙදෙන පරිදි ලිඛිත ව්‍යවහාරයෙන් ලියන්න.**

1 වනාන්තර මිනිසුන්ට සම්පතක්. ඉන් අපට ලැබෙන ප්‍රයෝජන අතිමහත්. ඒ බව හඳුනාගත් දුරදර්ශී මිනිස්සු, වන සම්පත ආරක්ෂා කර ගැනීමට කටයුතු කරනවා. අදූරදර්ශී මිනිස්සු වන සම්පත විනාශ කරනවා.

2 මුදල් ඇමතිතුමා අය-වැය කතාව ඉදිරිපත් කළා. ඉකුත් වර්ෂයේ ආර්ථික සංවර්ධනය සලකා බැලූ ඔහු නව ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළ අනාවරණය කළා. මන්ත්‍රීවරුන් නව යෝජනා ඉදිරිපත් කළා. විපක්ෂයේ මන්ත්‍රීවරු ද සතුට පළ කළා. ටික දෙනෙක් ඔහුගේ යෝජනා විවේචනය කළා.

3 සරසවියට නවක සිසුන් පැමිණේ. ජ්‍යෝෂ්ඨ සිසුන් නවකයින් ආදරයෙන් පිළිගතියි. සරසවි ඇදුරන් දේශන කටයුතු ආරම්භ කරයි. නවක සිසුන් සතුටින් ඉගෙන ගතියි.

1. වනාන්තර මිනිසුන්ට සම්පතකි. ඉන් අපට ලැබෙන ප්‍රයෝජන අතිමහත්ය. ඒ බව හඳුනාගත් දුරදර්ශී මිනිස්සු, වන සම්පත ආරක්ෂා කර ගැනීමට කටයුතු කරති. අදූරදර්ශී මිනිස්සු වන සම්පත විනාශ කරති.
2. මුදල් ඇමතිතුමා අය-වැය කතාව ඉදිරිපත් කළේය. ඉකුත් වර්ෂයේ ආර්ථික සංවර්ධනය සලකා බැලූ ඔහු නව ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළ අනාවරණය කළේය. මන්ත්‍රීවරුන් විසින් නව යෝජනා ඉදිරිපත් කරනු ලැබේය. විපක්ෂයේ මන්ත්‍රීවරු ද සතුට පළ කළහ. ටික දෙනෙක් ඔහුගේ යෝජනා විවේචනය කළහ.
3. සරසවියට නවක සිසුහු පැමිණෙති. ජ්‍යෙෂ්ඨ සිසුන් විසින් නවකයෝ ආදරයෙන් පිළිගනු ලබති. සරසවි ඇදුරන් විසින් දේශන කටයුතු ආරම්භ කරනු ලබයි. නවක සිසුහු සතුටින් ඉගෙන ගනිති.

- කර්ම කාරකයට හැරවිය හැක්කේ **සකර්මක ක්‍රියා පදයක් ඇති වාක්‍ය පමණි** ක්‍රියාව අකර්මක වේ නම් වාක්‍ය කර්ම කාරකයට හැරවිය නො හැකි ය.
- උදාහරණ:-

  1 ගායකයා ගී ගයයි. **(සකර්මක වාක්‍යය)**

  2 මල් පිපෙයි. **(අකර්මක වාක්‍යය)**

# විශේෂ වාක්‍ය රීති

**1. ආඛ්‍යාතය සම්පූර්ණ කිරීම සඳහා කර්තෘ පදයට අමතර ව තවත් නාම පදයක් උක්ත කිරීම**
(අවසාන ක්‍රියාවෙන් කියවෙන්නේ ඒ දෙදෙනා ම පිළිබඳ ව වන බැවින් මෙවැනි වාක්‍යයක ආඛ්‍යාතයට උක්ත දෙකක් වෙයි. එසේ හෙයින් මෙවැනි වාක්‍ය **ද්විත්ව උක්ත වාක්‍ය** නමින් ද ආඛ්‍යාතයේ අඩුව පුරවා සම්පූර්ණ කරන හෙයින් **ආඛ්‍යාත පූරණ** නමින් ද හැඳින්වේ.)

උදාහරණ:- 1 අපි නීතිගරුක පුරවැසියෝ වෙමු.
2 ඕ/ ඈ තිළියක් වූවා ය/ වෙයි.
3 තුඹලා අනාගත නායකයෝ වෙහු.
4 ජෝර්ජ් කීට් විදග්ධ චිත්‍ර ශිල්පියෙක් වෙයි.
5 අපි නීතිගරුක පුරවැසියෝ ය/ යි.
6 තුඹලා අනාගත නායකයෝ ද?
7 අශෝක රජතුමා දැහැමි පාලකයෙක් වූ.
8 අපි ශ්‍රී ලාංකික පුරවැසියෝ.

- **නිදොස් කර ලියන්න.**

1 ඔවුහු ක්‍රීඩකයන් වෙති. ×- ඔවුහු ක්‍රීඩකයෝ වෙති
2 මාර්ටින් වික්‍රමසිංහ විශිෂ්ට ලේඛකයකු වෙයි. ×- මාර්ටින් වික්‍රමසිංහ විශිෂ්ට ලේඛකයෙක් වෙයි
3 අසෝක රජතුමා දැහැමි පාලකයකු විය. ×- අශෝක රජතුමා දැහැමි පාල
4 අපි නීතිගරුක පුරවැසියන් වෙමු. ×- අපි නීතිගරුක පුරවැසියෝ වෙමු.
5 ඕ/ ඈ තිළියක වූවා ය/ වෙයි. ×- ඕ/ ඈ තිළියක් වූවාය.
6 තුඹලා අනාගත නායකයන් වෙහු. ×- තුඹලා අනාගත නායකයෝ වෙහු.
7 ජෝර්ජ් කීට් විදග්ධ චිත්‍ර ශිල්පියකු වෙයි. ×- ජෝර්ජ් කීට් විදග්ධ ශිල්පියෙක් වෙයි.

**2. උක්තය සම්පූර්ණ කිරීම සඳහා කර්තෘ පදයට අමතර ව තවත් නාම පදයක් උක්ත කිරීම.**
(උක්තය වසයෙන් යෙදෙන ප්‍රාණවාචී නාම පදයකට පසු ව **සංඛ්‍යාර්ථවත්** හෝ **සමූහාර්ථවත්** පදයක් යෙදෙන කල සංඛ්‍යාව හඟවන පදය හා එක් වන පිරිස් වාචී දෙන/ දෙනා යන පද බහු වචනය ගනී. මේ රීතිය **උක්ත පූරණ යෝගය** යනුවෙන් ද හැඳින්වේ.)

උදාහරණ:- 1 අපි සියල්ලෝ ම ශ්‍රී ලාංකිකයෝ වෙමු.
2 සිසුහු තිදෙනෙක් විශිෂ්ට සම්මාන හිමි කර ගත්හ.
3 කම්කරුවෝ පස් දෙනෙක් සතියකින් පාලම තනා නිම කළහ.
4 සොරු දෙදෙනෙක් අත්අඩංගුවට පත් වූහ.
5 ගොත්තු දෙදෙනෙක් ගැල ඇද්දෝ ය.
6 සැකකරුවෝ සියලු දෙනා නිදහස් කරනු ලැබූහ.
7 හරක් ~~[illegible]~~ දෙදෙනෙක් ලණුව කාගෙන ගියහ.
8 ගුරුවරු කිහිදෙනෙක් විනෝද ගියහ.

**3. ප්‍රශ්න වාචී යෙදුමකින් අවසන් වන වාක්‍යයක යෙදෙන කර්තෘ වාචක නාම පදය අනුක්ත ස්වරූපය ගනී.**

උදාහරණ:- 1 මිනිසුන් අවංක නොවන්නේ ඇයි?
2 දක්ෂ ක්‍රීඩිකාවක වන්නේ කෙසේ ද?
3 අප සාමය ළ!ගා කර ගන්නේ කවදා ද?
4 සංගමයේ සාමාජිකයන් බලාපොරොත්තු වන්නේ මොනවා ද?
5 මා ජීවිතය සාර්ථක වෙන්නේ කෙසේ ද?
6 තුඹලා උද්‍යාන හැඩ ලයි ද?

**4. ඇත, නැත, හැකි, යුතු, මැනවි, යෙහෙකි, වටී යන පදයකින් අවසන් වන වාක්‍යයන්හි කර්තෘ වාචක නාම පදය අනුක්ත ස්වරූපය ගනී.** (ඇත/නැත වලට මුලින් පූර්ව ක්‍රියාවක් හෝ භාව ක්‍රියාවක් යෙදුණ හොත් පමණි)

උදාහරණ:- 1 ගුරුවරුන් ඇතැම් පාඩම් අත් හරිනු ඇත.
2 සිසුන් පන්තියට පැමිණ නැත.
3 අප සමගිදම් රැකිය යුතු ය.
4 පයින් යන්නන් පාරේ දකුණු පසින් යා යුතු ය.
5 සියලු මිනිසුන් සත්‍යගරුක විය යුතු ය.
6 මා මහණදම් පිරිය යුතු ය.
7 පයින් යන්නන් පාරේ දකුණු පසින් යෑම මැනවි.
8 සියලු මිනිසුන් සත්‍යගරුක වීම මැනවි.
9 අප මේ ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා අධිකරණය හමුවට යෑම මැනවි.
10 අප ගිලනුන්ට උවටැන් කරනු වටී.
11 ඔවුන් එය වටහා ගැනීම යෙහෙකි.
12 ......මා...... සිරිපා කරුණාකර නැත.
13 ......ඔවුන්...... සූදානම් වී ඇත.
14 ......ගායකයෝ...... මිහිරි ගීයක් ගයනු ඇත.
15 ......ඔබ...... කථාවක් පවත්වනු ඇත.
16 ......අප...... සීගිරිය නරඹා නැත.

**5. ඇත, නැත, හැකි, යුතු යන රූප වරනැඟි වාක්‍යයක යෙදෙන කල ඒට සම්බන්ධ වන කර්තෘ උක්ත ස්වරූපය ගනී.**

උදාහරණ:-1 මම එය කියවා ඇත්තෙමි.
2 අපි සමගිදම් රැකිය යුත්තෙමු.
3 පයින් යන්නෝ පාරේ දකුණු පසින් යා යුත්තා හ.
4 සියලු මිනිස්සු සත්‍යගරුක විය යුත්තෝ ය.
5 මම මහණදම් පිරිය යුත්තෙමි.
6 ළමයෙක් කථාවක් පවත්වනු ......ඇත්තේය......
7 සංචාරකයෝ සීගිරිය නරඹා ......නැත්තෝය......
8 කුරුල්ලෝ කැදලි කරා පියඹනු ......ඇත්තාහ......

**6. තෙමේ/ තෙම , තොමෝ, තුමූ පද භාවිතය**
**(තෙමේ/ තෙම , තොමෝ, තුමූ** ප්‍රාණවාචී සර්ව නාම උක්ත රූප වේ. **තෙමේ/ තෙම** යන්න පුරුෂ ලිංග ඒක වචන යි. **තොමෝ** යන්න ස්ත්‍රී ලිංග ඒකවචන යි. තෙමේ, තොමෝ යන දෙකෙහි බහු වචනය **තුමූ** වේ.)

උදාහරණ :-1 ඒ තෙම/ තෙමේ ගමට ගියේ ය.
2 ඕ තොමෝ ගමට ගියා ය.
3 ඔවුහු තුමූ ගමට ගියහ.
4 සූර්ය තෙම/ තෙමේ චණ්ඩ රශ්මිය පතුරුවන්නට විය.
5 නදී තොමෝ සෙමෙන් ගලා බසින්නී ය.
6 ......සීතා තෙමේ විසිර ගියේය......
7 ......සීතා තෙම විසිර ගියේය......
8 ......සීතා තොමෝ විසිර ගියාය......
9 ......සීතා තුමූ විසිර ගියහ......

**1. නිවැරදි වාක්‍යයක් වීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.**

1 සියලු ජයග්‍රාහකයෝ පැරකුම් විද්‍යාලයේ (ශිෂ්‍යයන්/ ශිෂ්‍යයෝ) වූහ.

2 නිවැරදි වියරණ රීති (අපි/ අප) අනුගමනය කළ යුතු ය.

3 නොපසුබට උත්සාහයෙන් කටයුතු කළ ඕ තොමෝ මෙවර විභාගයෙන් සමත් (වූවා ය/ විය).

4 සියලු (රියැදුරන් /රියැදුරෝ) මාර්ග නීති අනුගමනය කළ යුත්තෝ ය.

5 පොදු ප්‍රශ්න විසඳීම සඳහා (නගරවාසීහු/ නගරවාසීන්) ඉදිරිපත් වීම මැනවි.

**2. පහත සඳහන් වාක්‍ය සදොස් නම් ඊට හේතු දක්වා නිදොස් කර ලියන්න.**

1 දෙස බස රැක ගැනීමට අපි නිබඳ ව තැත් කළ යුතුය.

අප - පූර්ව ක්‍රියාවක් සමඟ ශුද්ධ/ආඛ්‍යා/... ආදිය යෙදෙන විට අවසානයට යෙදෙන විට කර්තෘවාචක නාම පදය ආඛ්‍යාත ස්වරූපය ගනී.

2 සියලු දේශපාලනඥයෝ ආත්මාර්ථකාමී පුද්ගලයන් නොවේ.

පුද්ගලයෝ - ද්විත්ව උක්තාර්ථය (ආඛ්‍යාත පූර්ණය)

3 දරුවෝ දෙමාපියන්ට කීකරු වීම මැනවි.

දරුවන් - පූර්ව ක්‍රියාවක් සමඟ පුද්/ආඛ්‍යා/... ආදිය අවසානයට යෙදෙන විට කර්තෘවාචක නාම පදය ආඛ්‍යාත ස්වරූපය ගනී.

4 ගුරුවරු මීට පක්ෂ ව දැක්වූ අදහස් කවරේ ද?

ගුරුවරුන් ප්‍රශ්නවාචී යෙදුමකින් අවසන් වන වාක්‍යයක කර්තෘවාචක නාම පදය ආඛ්‍යාත ස්වරූපය ගනී.

5 ඕ තොමෝ ආදරයෙන් මවුපියන් රැකබලා ගත්තේ ය.

ගත්තීය - තොමෝ යනා ස්ත්‍රී ලිංග වචන වේ.

6 ඔවුන් නිදහස පතා සටන් කළ යුත්තෝ ය.

ඔවුහු - ආත, ඇත්, හැකි, යුතු යනාදී වරනැඟී වාක්‍යයක යෙදෙන විට ඊට අදාළව කර්තෘ උක්ත ස්වරූපය ගනී.

**3 පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.**

1 දෙමාපියෝ අප යහමග යැවූහ.

දෙමාපියන් විසින් අපි යහමග යවනු ලැබුවෙමු.

2 දරුවෝ ක්‍රිකට් ක්‍රීඩා කරති.

දරුවන් විසින් ක්‍රිකට් ක්‍රීඩා කරනු ලැබේ.

3 ගායකයෝ රසිකයන් සතුටට පත් කළහ.

ගායකයන් විසින් රසිකයෝ සතුටට පත් කරනු ලැබූහ.

4. කාර්මිකයෝ උද්ඝෝෂණය කරති.

කාර්මිකයන් විසින් උද්ඝෝෂණය කරනු ලැබේ.

5 දේශප්‍රේමීහු දේශය ආරක්ෂා කළහ.

දේශප්‍රේමීන් විසින් දේශය ආරක්ෂා කරනු ලැබේය.

# පසුගිය විභාග ගැටළු

2018 western p. Term test

(11) උක්ත නාම පද පමණක් යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) මිනිසා, අශ්වයා, ළමයෙක්, කාන්තාවෝ (2) කතක්, රජිනක, දරුවා, මිනිස්සු

(3) සොරා, නිළියක, අපි, ගුරුවරයා (4) මිනිසෙකු සතකු වෙළෙන්දකු සොරකු

(viii) පහත දක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කරන්න.

(අ) පෙර දා වට වැස්සෙන් නදී තොමෝ ප්‍රචණ්ඩ වූහ.

(ආ) සියලු ශිෂ්‍යයෝ විභාගය සමත් වීම යෙහෙකි.

(ix) දී ඇති කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයටත් කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයටත් හරවන්න.

(අ) නිතිඥයන් විසින් තම සේවාදායකයෝ දනුවත් කරන ලදහ.

(ආ) බුද්ධිමත් මිනිස්සු සොබා දහම ආරක්‍ෂා කරති.

---

2019 South p. Term test

(vii) පහත සඳහන් (අ) සහ (ආ) හි දක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) දරුවෝ ගුරු දෙගුරුන්ට කීකරු වීම මැනවි.

(ආ) ලාංකිකයෝ සාමය ළඟා කරගන්නේ කවදා ද?

(ix) පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) ශ්‍රී ලාංකිකයෝ දෙදෙනෙක් "රාවණාවන්" චන්ද්‍රිකාව අභ්‍යවකාශගත කිරීමට සමත් වූහ.

(ආ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කිරීම සඳහා නව තාක්ෂණික මෙවලම් භාවිත කරති.

---

2016 Western p. Term test

❖ 23 සහ 24 වාක්‍යවල උක්ත රූපය වැරදියට යොදා ඇති වාක්‍ය තෝරන්න .

(23) 1. ධනය ඇත්තන් මුදල් වියදම්කොට පින් දහම් කරති .
2. මමද එම් එම දින
3. නගර දෙකක් සතුරන් අතට පත්විය .
4. අයෙක් සිටියෝ වාද ඇසුමට

(24) 1. ඒ පර්වත ශිඛර අප විසින් දක්නා ලදී.
2. මිනිස්සු ගස් කපද්දී අපි එතැනට ගියෙමු .
3. සඟ වෙද ගුරු ගොවි කම්කරු බල ඇණියෙන් සිවු දිග සැරසේවා !
4. ඔහු කෘෂි විද්‍යාවේ හසළ බුද්ධිමතකු විය .

❖ 29 සිට 31 දක්වා ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව වැරදි එක් වාක්‍යයක් ඇත. අදාළ පිළිතුර තෝරන්න.

(29) 1. අපි නීතිගරුක පුරවැසියෝ වෙමු.
2. ඔවුහු දක්ෂ ශිෂ්‍යයෝලු .
3. ගොන්නු දෙදෙනෙකු ගැල ඇද්දාහ .
4. වෙරළ දිගේ සැරසිල්ලක් මෙන් හරිත වර්ණ ශාකයෝ පෙනෙන්නට වූහ.

(30) 1. ළමයින් විසින් චිත්‍ර අඳිනු ලැබේ.
2. අශෝක රජතුමා දැහැමි පාලකයෙක් විය.
3. කුමාර තෙමේ ස්නානය පිණිස උයනට ගියාය.
4. සියලු මිනිසුන් සත්‍ය ගරුක විය යුතුය.

(31) 1. දරුවන් වැඩිහිටියන් ට ගරු කිරීම වටී.
2. අප විභාගයට උනන්දු වන්නේ කවදාද ?
3. සිසුහු පන්තියට පැමිණ ඇත.
4. නුඹලා සියලු කටයුතු සාර්ථකව නිම කළෙහුය.

(32) A. මම හාත්සි පුටුවේ වාඩිවීමි. දරුවා ද ඉදිරියේ ඇති පුටුවේ වාඩි විය.
B. ඔබ හොඳින් පාඩම් කළ යුතු ය. විභාගයෙන් ජය ගත හැක
C. ගංවතුර ගලා ආවේය . ගෙවල් සියල්ල ද යටවිය.
D. ගුරුවරයා විද්‍යාගාරයට ගියේය. සිසුහු ද විද්‍යාගාරයට ගොස් වාඩිවූහ.


v. අ) පහත වාක්‍ය කර්මකාරකයට හරවන්න.
විදුහල්පතිතුමා ශිෂ්‍යයෙකු කැඳවයි.

ආ) පහත වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.
කම්කරුවා විසින් තම සේවා කටයුතු ස්වාමියාට පහදා දෙන ලදී.

ix. පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.

අ) ඕ තොමෝ ගමට ගියහ.

ආ) ඔවුන් නිදහස පතා සටන් කළ යුත්තෝ ය.


උත්තම පුරුෂ
ඒක වචන
බහු වචන
මම
අපි
අතීත
වර්තමාන
අනාගත
කළෙමි
කෙරුවෙමි
කළෙම
කරමි
කරම
කරන්නෙමි
කරන්නෙම
කළෙමු
කෙරුවෙමු
කරමු
කරම්හ
කරන්නෙමු
මධ්‍යම පුරුෂ
තුඹලා, තොපි, ඔබලා, ඔයාලා, තමුන්ලා, තමුන්නාන්සේ
තුඹ, ඔබ, ඔයා, තෝ, තමා, ඔබවහන්සේ
කරන්නෙහු
කරහු
කළෙහු
කෙරුවෙහු
කරන්නෙහි
කෙරෙහි
කළෙහි
කෙරුවෙහි
ප්‍රථම පුරුෂ
පුරුෂ ලිංග
ස්ත්‍රී ලිංග
නපුංසක ලිංග
පුටුව
මේසය
පොත, අත, පැන්සල
පුටු
මේස, බංකු, අත්, කකුල්, පෑන්
අම්මලා
මවුහු
ගුරුවරියෝ
කිරිල්ලියෝ
කළා ය
කෙරුවා ය
කරයි
කරන්නී ය
කළේ ය
කෙරුවේ ය
කරන්නේ ය
කරන්නෝ ය
කෙරුවෝ ය
කරත්
කරති
කළහ
කළෝ ය
කරන්නාහ